# අලි කොටි වලස්සු හා නරි

පසුගිය මැතිවරණයේදී අලි කොටි ගිවිසුමක් ගැන පළමුවෙන්ම කතා කළේ ජනතා විමුක්ති පෙරමුණ යැයි සිතමි. එසේ වුවත් අලි හා කොටි අතර එකඟත්වයට මග පෑදුයේ ෆොක්ස් ගිවිසුමය. එහෙත් ෆොක්ස් යන නම තිබූ පමණින්ම බ්‍රිතානියෝ හා අනෙක් බටහිරයෝ මෙහි දී නරි ලෙස නොහැඳින්වෙති. මෙහි දී බටහිරයන් හැඳින්වෙන්නේ වලසුන් ලෙසය. නරි යනුවෙන් හඳුන්වනු ලැබීමෙන් ගෞරව ලබන්නේ දෙමළ ජාතිවාදයට ආවඩන මෙරට රාජ්‍ය නොවන සංවිධානවල හා විශ්වවිද්‍යාලවල ඊනියා උගතුන්, විශ්‍රාමික නව්‍ය හා හිටපු මාක්සවාදීන්, එක්ස් යනුවෙන් තමන් හඳුන්වා ගන්නා හෙළුවැලි අශිෂ්ටයින් (මොවුන් එක්ස් වුවද එක්ස් යන්නන් ගණිතයෙහි කියැවෙන්නේ කුමක්ද කියාවත් නොදන්නා බව ඔවුන් එක්ස් ගැන ලියන දෙයින් පැහැදිලි වෙයි. මොවුන් අශිෂ්ටයන් වන්නේ හෙළුවට වඩා බටහිරයන්ගේ ඊනියා ශිෂ්ට බව අධිපතිවාදී ආකාරය කින් අප මත පැටවීමට කතා කරන නිසාය.) ඊනියා ප්‍රබුද්ධ කලාකරුවන් බොරු දාර්ශනිකයන් ආදී පිරිසය. නරි කරන්නේ අලි විශේෂයෙන්ම කොටි වෙනුවෙන් කඩේ යෑමය. ඒ නිසා ම ඔවුහු වලසුන් වෙනුවෙන් ද කඩේ යති. ප්‍රාග් ධනය හා ධනපති ක්‍රමය ගැන ලියූ කාල් මාක්ස ද අවසන් වශයෙන් ගත් කළ වලසුන් වෙනුවෙන් කඩේ ගියු කඩේ යෑමට හැකි වන්නේ ම ධනපති ක්‍රමය තුළ වීම මොන තරම් අපුරුවක්ද?) සංස්කෘතික අධිරාජ්‍යවාදියකු බැවින් ඔහුගේ විවිධ මී මුණුබුරන් ද එලෙස කඩේ යෑම ගැන පුදුමයට පත් නොවිය යුතුය. ජාතික යැයි කියාගන්නා විජාතික රූපවාහිනියට අද මෙ නරි නැතිව ම බැරිය. නරියකු හෝ නරිච්චියක හෝ හු නොකීවහොත් ඔවුන්ගේ ඊනියා ප්‍රවෘත්ති ද ඇතුළු දේශපාලන වැඩසටහන් සම්පූර්ණ නොවේ.

ෆොක්ස් ගිවිසුම අත්සන් කළේ එ. ජා. පකෂයට පොදු පෙරමුණ නවත්වන තැනින් පටන් ගෙන රට පාවාදීමේ කටයුත්ත කරගෙන යෑමට බව අපි ඒ දිනවලම පෙන්වා දුන්නෙමු. අද ඒ අනුව වලස්සු ඉතා වේගයෙන් ඉදිරියට දුව යති. නෝර්වේ නම් දුර්වල කුඩා රට තිබෙන් නේ හිම වලසුන් ඉන්නා උත්තර ධ්‍රැවයට ආසන්නෙයනි. මොවුන්ට ශක්තිය ලැබෙන්නේ දෙමළ ජාතිවාදය මෙරට බෞතීස්ම කළ බ්‍රිතානින්ගෙන් හා අද බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙ මෙන්ම ක්‍රිස්තියානි මූලධර්මවාදී ආගමික ව්‍යාජතිවාදයෙ ද ප්‍රධානීන් වූ ඇමරිකානුවන්ගෙනි. අලි කොටි වලස් ගිවිසුමෙ (හෝ එකඟතාවයේ) ප්‍රතිඵලයක් ලෙස පසුගිය දිනවල කොටින්ට අධිබල ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ තොගයක් පිටරටින් ලැබිණි. අද අනාවරණය වී ඇති ආකාරයට ඒ උපකරණ කට්ටල් ගෙන්වා ඇත්තේ නෝර්වේ තානාපති වෙස්ට්බර්ග් නමටය. නෝර්වේ තානාපති නමට එවන ලද බැවින් ඒ උපකරණවලට රේගු බදු අය නොකෙරුණා පමණක් නොවේ. ඒ ගැන සොයා බැලීමක් ද නොකෙරිණි. එහෙත් ඒ උපකරණ කොටි සංවිධානය අතට පත් වූයේ ඉතාමත් උපක්‍රමිකවය. උපකරණ කොටින්ට දීම සඳහා ප්‍රවාහනය කෙරී ඇත්තේ ආරකෂක අමාත්‍යංශයේ අනුදැනුම යටතේය.

මෙහි වඩාත්ම බරපතල සිද්ධිය නම් නෝර්වේ තානාපති විසින් ගෙන්වන ලද ඉතා සියුම් සම්ප්‍රේෂණ උපකරණ තොගයක් ආරකෂක අමාත්‍යංශයට සොයා ගැනීමට නොහැකිවීමය. ඒ උපකරණ මාර්ගයෙන් ඉන්දියාව ද ඇතුළු විශාල ප්‍රදේශයකට ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු කිරීමට කොටින්ට හැකි වන බවත් අවශ්‍ය වූවද ඒ ප්‍රචාර නැවැත්වීමට (එයට බාධා කිරීමට) ආණ්ඩුවට දැනට උපකරණ නැති බවත් අනාවරණය වී ඇත. පසුගියදා ඉන්දියාවේ විදේශ ලේකම් මේ රටට තකහනියක් පැමිණියේ මේ පිළිබඳ සොයා බැලීමට බව පැවසෙයි. මෙවැනි ගුවන් විදුලි ප්‍රචාර සඳහා ලංකාවේ භූමිය යොදා ගැනීමට ඉඩ දීම ඉන්දු ලංකා ගිවිසුමට පටහැනි බවද ඉන්දියාවේ මතය වී ඇත.

නෝර්වේ තානාපති හෝ මෙරට ඇතැයි කියන ආණ්ඩුව හෝ මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර නැත. නෝර්වේ තානාපති හදිසියේ ආපසු නෝර්වේ බලා ගොස් ඇති අතර ඔහු මෙරට ඉන්දියාවේ තානාපතිවරයාට නම් යම් පැහැදිලි කිරීමක් කර ඇතැයි පැවසෙයි. එයින් පෙනී යන්නේ නෝර්වේ තානාපතිට මෙරට අගමැතිට හෝ විදේශ අමාත්‍යංශයට හෝ කීමට දෙයක් නොතිබූ බවය. ඒ නෝර්වේ තානාපති මෙන්ම අදාළ සියලු දෙනාම ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ කොටින්ගේ අතට පත් වූයේ කෙසේ ද යන්න දැන සිටි බවය. ඒ සියල්ල සිදුවී ඇත්තේ අලි කොටි වලස් එකඟතාවකින් බව මේ සියල්ලෙන් පැහැදිලි වෙයි.

© Prof. Nalin De Silva

පසුගිය කාලයේ ඉරණවිල සම්ප්‍රේෂණාගාරයක් ඉදිකිරීම සම්බන්ධයෙන් දැඩි උද්ඝෝෂණයක් පැවැත්විණි. එහෙත් අලි කොටි වලස් එකගතාවයෙන් කොටින්ට සම්ප්‍රේෂණ උපකරණ ලැබෙන විට නරි නිහඬය. ඔවුන් ලිප්ටන් වටරවුමට හෝ කොටුව දුම්රියපොළ ඉදිරිපට හෝ එකතු වී කරන හූ කීම ද මෙදා නැත. නරි හා නරිච්චියන් ඉන්නේ අලි කොටි වලසුන්ට අවශ්‍ය ආකාරයට හූ කීමට පමණක් බව පැහැදිලිය. දළදා මාලිගාවට ගුවන් විදුලි සම්ප්‍රේෂණ සඳහා අවසර නොදුන් ඇමැතිවරු දළදා මාළිගාවට බෝම්බ ගැසූ කොටින්ට අවශ්‍ය සම්ප්‍රේෂණ උපකරණ ජනතාවට හොරෙන් නෝර්වේ තානාපති හරහා ගෙනැවිත් ආරක්‍ෂක අමාත්‍යංශය යටතේ ම ප්‍රවාහනය කර භාර දෙති. මෙයට සම්බන්ධ සියල්ලෝම ජාති ද්‍රෝහීහු වෙති. දේශ ද්‍රෝහීහු වෙති.

මේ දේශ ද්‍රෝහී ජාති ද්‍රෝහීන්ට කළ යුත්තේ කුමක්ද ජනාධිපතිනියට මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කළ හැකි දේ කිහිපයක් ඇත. 1971 සමයේ උතුරු කොරියානු තානාපති කාර්යාලය ආපසු යැවීමට චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ මව වූ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය කටයුතු කළාය. අද ජනාධිපතිනිය කළ යුත්තේ වෙස්ට්බර්ග් නම් තානාපති ආපසු යැවීම පමණක් නොවේ නෝර්වේ සමග සියලු තානාපති සම්බන්ධකම් නැවැත්වීමය. එහෙත් ප්‍රායෝගිකව එසේ කිරීමේදී අද ප්‍රශ්න මතුවන බව රහසක් නොවේ. නෝර්වේ නම් කුඩා වලසා සමග බ්‍රිතානිය හා ඇමරිකාව යන මහා වලස්සු වෙති. අනෙක් අතට නෝර්වේ සම්බන්ධයෙන් එවැනි දෙයක් කළ වහාම කොටි ද වලස්සු ද නරි ද එකතු වී සාම හොරණෑව ගයමින් ඊනියා සාමය කඩා කප්පල් කෙරුවෝ යැයි කෑ ගැසීමට (හූ කීමට) සූදානම්ව සිටිති. මේ කාලකන්නි සාමය කඩාකප්පල් කිරීමට පියවර ගැනීම අද ජනාධිපතිනියගේ යුතු කමක් මෙන් ම වගකීමක් බවටද පත්වී ඇත. එහෙත් නෛතිකව එවැනි දෙයක් කිරීම සඳහා ඇය දේශපාලනික වශයෙන් ශක්තිමත් කළ යුතුව ඇත. අද ප්‍රශ්නය වී ඇත්තේ කාර්යයන් කිහිපයක් සඳහාම ජනාධිපතිනිය දේශපාලන වශයෙන් ශක්තිමත් කරන්නේ කෙසේද යන්නය.

ජනාධිපතිනියට අද වැදගත් කාර්යයන් හතරක් කිරීමට ඇත. පළමුවෙන්ම නෝර්වේ තානාපති සම්බන්ධකම් නැති කිරීමය. දෙවනුව නැගෙනහිර පළාත උතුරු පළාතෙන් වෙන් කර ඒ සඳහා වෙනම ආණ්ඩුකාරවරයකු පත් කිරීමය. තුන්වැනි කරුණ වන්නේ අධි ආරක්ෂිත කලාප සම්බන්ධයෙන් දැඩි තීරණයක් ගැනීමය. හතරවැනි කරුණ විකල්ප ආණ්ඩුවක් (ඇත්තටම ආණ්ඩුවක් අද මෙරට ආණ්ඩුවක් නැත. ඇත්තේ නෝර්වේ තානාපති කාර්යාලයකි) පිහිටුවීමට කටයුතු කිරීමය. නැගෙනහිර පළාත වෙන් කිරීම සම්බන්ධයෙන් ඉහත දී බොහෝ කරුණු ලියා ඇති බැවින් නැවත ලිවීම අනවශ්‍ය වෙයි. තුන්වැනි හා හතරවැනි කරුණු සම්බන්ධයෙන් කරුණක් දෙකක් සඳහන් කළ යුතුව ඇත.

අධි ආරක්ෂිත කලාපවලට සාමාන්‍ය ජනයාට යෑම සඳහා යැයි කියමින් ඒ කලාපවලින් හමුදා ඉවත් කර ගන්නා ලෙස අද කොටි ත්‍රස්තවාදීහු මහත් බලපෑමක් ඇති කරති. මේ දෙමළ ජනතාව වෙනුවෙන් කරන ඉල්ලීමක් නොව කොටි ත්‍රස්තවාදීන් වෙනුවෙන් කරන ඉල්ලීමක් බව නොදන්නා පිරිසක් වේ නම් ඒ නරිම වෙති. දෙමළ ජනයා පැහැර ගන්නා කොටින්ට ඔවුන් වෙනුවෙන් කතා කිරීමට ඇති අයිතිය කුමක්ද? අධි ආරක්ෂිත කලාප සම්බන්ධයෙන් මේජර් ජෙනරල් සරත් ෆොන්සේකා මහතා ඉදිරිපත් කර ඇති කොන්දේසි අනුව කොටි ආයුධ භාර දිය යුතුය. හමුදාවට ඒ ප්‍රදේශවලට ගොස් පරීක්‍ෂා කිරීමට ඉඩ තිබිය යුතුය. එහෙත් තමිල්සෙල්වම් නම් ත්‍රස්තවාදියා කියා

අලි කොටි

ඇත්තේ තවම විශ්වාසය ගොඩ නැගී නැති හෙයින් ඒ කළ නොහැකි බවය. එහෙත් ඔහුට අනුව හමුදාව කොටි කෙරෙහි විශ්වාසය ඇති කර ගනිමින් අධි ආරක්ෂිත කලාපවලින් ඉවත් විය යුතුය. මේ කතා ආරක්‍ෂක අමාත්‍යංශයේ පොල් පිති ගොනුන්ට හොඳ වුවත් හමුදාවට හොඳ නැත. එබැවින් ජනාධිපතිනියට මේ සම්බන්ධයෙන් ද මැදිහත්වීමට සිදු වනු ඇත.

මේ සියලු කාර්යයන්හි දී ජනාධිපතිනිය දේශපාලනිකව ශක්තිමත් කිරීමට සිදුවී ඇත. රට පාවා නොදෙන විකල්ප ආණ්ඩුවක අවශ්‍යතාව අද පැන නැගී ඇත. එහිදී පොදුජන එක්සත් පෙරමුණේ ජාතිකවාදී බලවේග ශක්තිමත් කිරීමත් ජනතාව සංවිධානය කිරීමත් අවශ්‍ය වෙයි. ශ්‍රී. ල. නි පක්‍ෂය හා ජ. වි. පෙරමුණ අතර යම් එකගතාවක් ඇති කර ගැනීමට පක්‍ෂ දෙකම කටයුතු කරනු පෙනෙයි. මෙය සුබ පෙර නිමිත්තකි. මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක්

© Prof. Nalin De Silva

කරන බද්දේගම සමිත මන්ත්‍රී හාමුදුරුවන් කියා ඇත්තේ එවැනි එකඟතාවක් ඇති වුවහොත් එතුමන් පොදු පෙරමුණ හැර දා යන බවය. සමහරවිට මේ සමසමාජ පක්ෂය වෙනුවෙන් කළ ප්‍රකාශයක් ද විය හැකිය. කෙසේ වෙතත් සමසමාජ පක්ෂයට හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට මේ අවස්ථාවේ දී රටට කළ හැකි හොඳම සේවය ජනතා විමුක්ති පෙරමුණට ශ්‍රී. ල. නි. පක්ෂය, ම එ. පෙරමුණ ආදී පක්ෂ සමඟ එකතු වී වඩා ශක්තිමත් දේශපාලන සංධානයක් ඇති කර ගැනීමට ඉඩ දී පොදු පෙරමුණෙන් ඉවත් වීමය. අද රටට ඇති ප්‍රශ්නය මේ පක්ෂ එසේ ඉවත්වීම නොව ඉවත් නොවී පොදු පෙරමුණේ ම ලැග සිටීමය.

සමිත මන්ත්‍රී හාමුදුරුවන් කුමක් කීවත් එතුමන්ට ලැබුණේ සමසමාජ පක්ෂයක් සඳහා දුන් ඡන්ද නොවේ. ඇන්. ඇම්. පෙරේරා මහතාගේ බෑණනුවන් වූ තිස්ස විතාරණ මහතාට යටියන්තොටින් ඡන්ද කීයක් ලැබුණෙ ද සමිත හාමුදුරුවන් මන්ත්‍රී වූයේ සමසමාජයට ලැබුණු ඡන්දවලින් නොව අපවත්වී වදාළ ගණේගම සරණංකර හිමි වැඩ විසූ දුටුගැමුණු පිරිවෙනට දුන් ඡන්දවලිනි. අප බොහෝ අවස්ථාවල සඳහන් කර ඇති පරිදි පසුගිය මහා මැතිවරණයේ දී සිංහලයන්ගෙන් විශේෂයෙන්ම සිංහල බෞද්ධයන්ගෙන් බහුතරය ඡන්දය දුන්නේ පොදු ජන එක්සත් පෙරමුණට හා ජනතා විමුක්ති පෙරමුණටය. එපමණක් නොව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පසුගිය වතාවේ ජනාධිපති පදවියට පත්වූයේද සිංහලයන්ගේ ඡන්දවලිනි. සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය පොදු පෙරමුණෙන් ස්වෙච්ඡාවෙන් ඉවත් නොවන්නේ නම් රටේත් ජාතියේත් යහපත සඳහා ඔවුන් ඉන් ඉවත් කළ යුතුය. එසේ ඉවත් කළ පසු ඔවුනට ද ඉතිහාසය ගැන කිසිම වැටහීමක් නැති ගැලවීම සඳහා බොරු දෙසන වික්‍රමබාහුලා සමඟ එකතු වී සමසමාජ පක්ෂ කාර්යාලය අසළ ඇති ලිප්ටන් වට රවුමේ සුපුරුදු දේශපාලනය කර ගෙන ගිය හැකිය. සමිත මන්ත්‍රී හාමුදුරුවන්ට එවිට විජාතික රූපවාහිනිය නෙස්ටමෝල්ට් ගිලන්පස සමගින් තව තවත් විවෘත වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva